# ජාතික ඖෂධ නියාමන අධිකාරිය

## තනතුරු පුරප්පාඩු

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත තනතුරු වේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොළඹ පමණක් පිහිටා ඇති අතර, වෙනත් ශාඛා කාර්යාල නොමැති බැවින් ස්ථාන මාරු වීම් රහිත වේ.

### කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම්

පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ මාස 06කට නොඅඩු තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවත් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ මාස හයකට (06) නොඅඩු තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවත් ලබා තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස** : අවු: 18ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරට අදාළ වැටුප් පියවර**: කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 පරිදි MA1-1-2016 (27,910-10X300-7X350-4X495-20X660-48,540 ) වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු.27,910/- හා අනුමත දීමනා

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක හා/හෝ පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

ලිඛිත තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය

(අ) භාෂා ප්‍රවීණතාව

(ආ) අභියෝගතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම

(ඇ) පරිගණක පරීක්ෂණය

**වෙනත් කරුණු** :

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.
- මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකුම රු.1,000/- ක මුදලක් ජාතික ඖෂධ නියාමන අධිකාරිය නමින් ලංකා බැංකුවේ රීජන්ට් වීදි ශාඛාවේ ගිණුම් අංක 78088835 දරන ගිණුමට බැර වන පරිදි ගෙවිය යුතු අතර, අයදුම්කරු නමින් ලබා ගත්තා ලදුපත අයදුම්පත්‍රයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.08.14 හෝ එදිනට පෙර ලැබෙන සේ ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල, 02 වන මහල, අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය.**

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය

### කළමනාකරණ සහකාර තනතුර සඳහා අයදුම්පත

1. පෞද්ගලික තොරතුරු :

1.1 සම්පූර්ණ නම :-

1.2 මුලකුරු සමග නම:-

1.3 ස්ත්‍රී/ පුරුෂ භාවය:-

1.4 උපන් දිනය:-

1.5 වයස:- අවු:............... මාස: ................... දින: ...............

1.6 ජාතික හැඳුනුම්පත් අංකය:-

1.7 දුරකථන අංකය :- ස්ථාවර:..................ජංගම : ...............

1.8 විද්‍යුත් තැපැල් ලිපිනය

1.9 ලිපිනය:-

1.10 පදිංචි දිස්ත්‍රික්කය:-

2. විභාගයට පෙනී සිටින මාධ්‍යය:-

3. අධ්‍යාපන සුදුසුකම්: (ඉහළම සුදුසුකමේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය/ ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන්/ සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

4. වෘත්තීය සුදුසුකම් :

| අනු අංකය | සුදුසුකම | විශ්වවිද්‍යාලය/ ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය / වලංගු දිනය | විෂයයන්/ සාමාර්ථය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

5. පළපුරුද්ද : (දැනට දරන තනතුරේ සිට අනුපිළිවෙලට සඳහන් කරන්න)

| අනු අංකය | තනතුර | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |

6. අයදුම්කරු පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක හා ලිපිනයන්:

7. අයදුම්කරුගේ සහතිකය:

මෙහි ඉහතින් දක්වා ඇති මා පිළිබඳ තොරතුරු මාගේ දැනීම, විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය: ..............................

(අයදුම්කරුගේ අත්සන)

8. රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් තම ආයතන ප්‍රධානියාගේ සහතිකය:

මෙම ඉල්ලුම්කරු වන .................................... මහතා/ මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .......................... ............ වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවත් දන්වමි.

..........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

**සැළකිය යුතුයි:-**

**අදාළ ආකෘතියට අනුව පමණක් අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවිය යුතු අතර** ඔබගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකපත්‍ර වල පිටපත් අයදුම්පත්‍රය සමග යොමු කළ යුතු වේ. මෙම ආකෘතියට අනුව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, මුදල් ගෙවූ ලදුපත ඉදිරිපත් කර නොමැති අයදුම්පත් හෝ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.